අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව.
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූනි 24 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 16 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය තුල සංවර්ධනය කර තිබූ ජල යෝජනා ක්‍රම 02 ක හා සුසාන භූමියක වටිනාකම වූ රු.600,000 ක් සහ මහජන පුස්තකාල සඳහා මිලදීගෙන තිබූ ලී බඩු සවිකිරීම්වල වටිනාකම වූ රු.327,504 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සභාව සතු ගොඩනැගිලි 2 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයන්ට අදාළ සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු එකතුව රු.54,900ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වේ.

(ඈ) 2015 වර්ෂයේ ප්‍රාග්ධන ආධාර රු.105,918ක් අඩුවෙන් ද, ප්‍රාග්ධන වියදම රු.972,290 ක් වැඩියෙන් ද දැක්වේ.

(ඉ) 2015 වර්ෂයේදී පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලබා දී තිබුණු ඩම්ප් ට්‍රක් රථයේ හා කෘෂ කැබ් රථයේ පිරිවැය නිවැරදිව ගිණුම්ගත නොකර පෞද්ගලික වාහන වෙළඳාම් ආයතනයකින් ලබාගත් විධිමත් නොවූ රු.8,723,220ක වටිනාකමක් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 ලැබිය යුතු ගිණුම්
----------------------

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 05 ක එකතුව රු.3,620,500ක්වූ අතර, ඊට වර්ෂ 05කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින රු.2,922,274 ක් වූ ශේෂයක්ද ඇතුළත්ව තිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

---------------------

(අ) ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 05 ක වටිනාකම රු.4,431,647 ක්වූ අතර, වර්ෂ 05කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින එකතුව රු.1,897,749 ක් වූ ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

(ආ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට යැවිය යුතු රු.813,670ක දායක මුදලක් පැවති අතර, වර්ෂ 06කට වැඩි කාලයක සිට පැවත එන රු.626,974ක ශේෂයක් ද ඊට ඇතුළත් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

ගිණුම් විෂයයන් 08කට අදාලව අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.4,188,942 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

----------------------------------------------------

වර්ෂ 17 පමණ කාලයක සිට පැවත එන රු.272,984ක ඉකුත් තැන්පතු 12 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.532,059 ක්වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.303,652 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.835,711ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

--------------------------------------

සභාව සතු ජල යෝජනා ක්‍රම 07 හි 2015 දෙසැම්බර් 31 දක්වා බිල්කළ ආදායම රු.829,395ක් වූ අතර, 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල රු.266,350ක් විය. ඉන් 2016 ජූලි 10 දින වන විට අයවිය යුතු මුදල රු.81,161 වූ අතර, ජල බිල්පත් නොගෙවීම මත සැපයුම විසන්ධි කර තිබුණු ජල පාරිභෝගිකයින් 33 දෙනෙකුගෙන් අයවිය යුතු රු.40,525 ක් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

2.2.2 අක්කර බදු

-------------

2015දෙසැම්බර් 31 දිනට රු56,628ක හිඟ ශේෂයක් පැවතුණි.

2.2.3 බදු කුලී

-----------

2015 දෙසැම්බර් 31 දිනට බදු දී තිබුණු කඩකාමර වෙනුවෙන් රු.51,765 ක ශේෂයක් අයවීමට තිබුණි. ඉන් 2016 ජූලි 10 වන විට තවදුරටත් අයවියයුතුව තිබූ බදු කුලී ශේෂය රු.13,980 ක් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.176,632ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,280,426 ක මුදලක් අයවිය යුතුව තිබුණි. ඉන් 2016 ජූලි 10 දින වන විට උසාවි දඩ වෙනුවෙන් පමණක් තවදුරටත් අයවියයුතු ශේෂය රු.21,750 ක් විය

2.3 අධිභාර

-----------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂ වලදී පනවන ලද අධිභාර වලට අදාලව 2015 දෙසැම්බර් 31 දිනට රු.69,800ක මුදලක් අයවියයුතුව තිබුණි. ඉන් 2016 ජූලි වන විට අයවියයුතු මුදල රු.60,300ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්යසාධන ඇගයීම

-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ අයවැය යෝජනා අනුව, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ ඇති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් කුඩා නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මැටිහක්ක නගරයේ ඉටු කිරීමට යෝජිතව තිබූණු ආර්ථික මධ්‍යස්ථානයක්, අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග, රථ ගාල ඉදිකිරීම, මැටිහක්ක ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම හා ත්‍රීරෝද රථ ගාල ඉදිකිරීම ආදිය ඇතුළත් සංවර්ධන ව්‍යාපෘති සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ 2015 වර්ෂය තුල ව්‍යාපෘති 02ක් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් 2015 දෙසැම්බර් 14 දින රු.1,000,000 ක මුදලක් සභාව වෙත ලබාදී තිබූ නමුත්, 2016 ජූලි වන විටත්, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවේ අනුමත තනතුරු 12 ක පුරප්පාඩු 19 ක් පැවති අතර, අනුමත තනතුරක් වූ ආදායම් පරීක්ෂක තනතුර ද පුරප්පාඩුව පැවති බැවින් ආදායම් එකතු කිරීම ඉතා දුෂ්කර කාර්යයක්ව පැවතුණි. නව ආදායම් මාර්ග වලට ප්‍රවේශ වීමට හා පවතින ආදායම් අයකිරීම කෙරෙහි මෙම තත්ත්වය බලපා තිබුණි.

(ආ) සභාවට අනුයුක්ත මාර්ග කම්කරුවන් හා සෞඛ්‍ය කම්කරුවන් එම තනතුරුවල රාජකාරි සඳහා යෙදවීමක් දක්නට නොලැබුණු අතර, පුරප්පාඩු පැවතීම හා තනතුරු අනුමත නොකිරීම මත ජල පොම්පාගාර වලට සෞඛ්‍ය කම්කරුවන් අනුයුක්ත කිරීමද සිදුව තිබුණි. මේ හේතුවෙන් මාර්ග පවිත්‍ර කටයුතු, මාර්ග දෙපස එළිකිරීම ආදි සේවාවන් සභාවෙන් ඉටුවී නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

සභාව සතු ජල යෝජනා ක්‍රම 03ක් යටතේ සවිකර තිබුණු ජල මනු 112ක් සඳහා රු.336,000ක ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 අවිධිමත් ගනුදෙනු
---------------------

ප්‍රාදේශීය සභාවට අදාලව විනය පරීක්ෂණයක් සිදුකර තිබූ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරියෙකු වෙත පරීක්ෂණයේ ගමන් වියදම් ලෙස සභාවෙන් රු.24,407ක් ගෙවා තිබුණි. එකී නිලධාරියා විසින් පරීක්ෂණයට අදාල 2015 නොවැම්බර් 03 දිනය සඳහා 2015 නොවැම්බර් 11 දින හා 2015 දෙසැම්බර් 30 දින වවුචර්පත් දෙකක් ඉදිරිපත් කර රු.2,440 බැගින් දෙවරක් ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවා තිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
----------------------------------------

4.1 අයවැය පාලනය
--------------------

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකියයුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව ආදායම් විෂයයන් 09 කට අදාල රු.347,500 ක ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් උපයාගෙන නොතිබුණු අතර, ආදායම් විෂයයන් 07 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 43 සිට සියයට 97 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ආ) වැය විෂයයන් 26 ක් සඳහා සලසා තිබුණු රු.835,160ක ප්‍රතිපාදන වලින් වර්ෂය තුල කිසිදු වියදමක් දරා නොතිබුණු අතර, වැය විෂයයන් 25 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම් අතර, සියයට 32 සිට සියයට 99 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය
---------------------------

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 5(7) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු
--------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/ඩීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

-----------------------------

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

සභාව සතුව පැවැති යන්ත්‍ර උපකරණයක් හා වාහන 03 ක් වර්ෂ 01 සිට 04 දක්වා කාලයක සිට ඵලදායී කටයුත්තකට යොදා නොගෙන සභා භූමියේ නිශ්කාර්යව ගාල්කර තිබූ අතර ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ පැවැති වාහන 04 ක් වෙන්දේසි කිරීමට හෝ සුදුස්සක් කර ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලනය

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) ණයගැති හා ණය හිමි පාලනය